# 15 සිර ගෙය

කොළඹ යුගයේ කීර්තිමත් කවියකු වූ විමලරත්න කුමාරගම මහතා විසින් පුවත්පත් සඟරා ආදියට සපයන ලද කවි පන්ති ගණන අතිවිශාල ය. එතුමාගේ කෘතියක් වන හපුමලී කාව්‍ය ග්‍රන්ථය සමකාලීන කාව්‍ය ග්‍රන්ථ අතර වැදගත් තැනක් ගනී. ආගන්තුක සත්කාරය, මුතුගේ ප්‍රශ්නය, හේරත්හාමි, අයියනායක ආදි පද්‍ය පන්ති එතුමා තුළ පැවති මානව දයාවත් ප්‍රතිභාවත් මතු කර පෙන්වන රචනා ය. එතුමාගේ කාව්‍ය රචනා 'විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි' නමින් පොතක් වශයෙන් ද පළ වී ඇත. මෙහි දක්වෙන්නේ වන්නියේ ආදායම් පාලක නිලධාරිවරයෙකු වශයෙන් රාජකාරි කරද්දී එතුමා විසින් රචිත පද්‍ය කිහිපයකි. කවි රස විඳීමේ ශක්තිය හා භාෂා පරිහරණ හැකියා වර්ධනය කර ගැනීම සඳහා මේ පද්‍ය පන්තිය ඔබට උපකාරී වනු ඇත.

වැලිමාවත් ලෙසින් ඇති ගං හෝ දොළය
උණුසුම උරා බී ගති වැව්වල ජලය
හැම තැන ගසා ගෙන යන වියළුණු කොළය
ගිනියම් සුළඟ තුළ ඇති ලෙඩකර බලය

සැතපුම් විසි දෙකක් දුර පිටිසර ගමක
ඇතින්නියක් සහ පැටවෙක් ගල් වළක
වැටී සිටිති ඉන් පිට වී ගත නොහැක
යන පණිවුඩය ලැබුණේ මේ වැනි දිනෙක

බෑවුම් ගතිය ඇති ඒ ගල් තලය පිටේ
අලි කොටි වලස් පියවර එහි නිතර ගැටේ
ඔප මට ගතිය පවතී වළ වට ම කටේ
හැම සතියකම මෙහි කිසියම් සතෙක් වැටේ

කොපමණ දැගලුවත් ගල් වළ ඉවුරු මැඩ
ඉන් මතුවෙන්ට කිසිලෙසකින් නොමැත ඉඩ
නොසිඳී තිබුණු නියඟෙට මේ වතුර කඩ
සිරගෙය වුණේ කොහොමද ඇතියකුට සොඬ



බලයේ බලය වූ මහ එකෙකුට ද මෙසේ
මෙය හිර ගෙයක් වූ බව අදහමු ද කෙසේ
තරුවැළ පෙනී මහ රෑ මැද අහස කුසේ
ඇගෙ දුක කියන හැටි ගවුගණනකට ඇසේ

නුග අතු ඇහැටු දළු ගෙන එන විට දි ළඟා
එළවා ගනී වියරුව පැන සොඬය නඟා
හත් දවසක් ම මේ දුක්මුසු රැඟුම රඟා
ඈ බැරි තැන වුණා ඒ වළ තුළ ම දිගා

## ක්‍රියාකාරකම 01

01. පහත දැක්වෙන එක් එක් යෙදුමේ අදහස තනි වාක්‍යයක් වශයෙන් ලියන්න.
   1. වැලිමාවත් ලෙසින් ඇති ගං හෝ දොළය
   2. අලි කොටි වලස් පියවර එහි නිතර ගැටේ
   3. සිරගෙය වුණේ කොහොම ද ඇතියකුට සොඬ
   4. ඈ බැරි තැන වුණා ඒ වළ තුළ ම දිගා

## ක්‍රියාකාරකම 02

01. මෙහි දැක්වෙන සිද්ධිය පණිවුඩයක ආකාරයෙන් ලියන්න.

02. මේ කවි පෙළෙහි දැක්වෙන ගල් වළෙහි ස්වරූපය විස්තර කරන්න.

03. ඒ තද නියං සමයක් බව දැක්වීමට කවිපෙළේ ඇති සාධක මොනවා ද?

04. සිරගෙය යන මාතෘකාව මේ කවි පෙළට යෙදීම කොතෙක් දුරට සාධාරණ ද?

## ක්‍රියාකාරකම 03

**01. පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද රූපයෙන් සමාන වුවත් අර්ථයෙන් වෙනස් බව වාක්‍ය මඟින් පැහැදිලි කරන්න.**

| | |
|---|---|
| වැස්ස පායනවා | හඳ පායනවා |
| තරහ යනවා | නින්ද යනවා |
| සුළං ගහනවා | අඬ ගහනවා |

## ක්‍රියාකාරකම 04

**ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ තවත් විශේෂ වාක්‍ය රීති දෙකක් පහත සඳහන් වාක්‍ය කිහිපයෙන් ඉස්මතු වෙයි.**

මුව රළ වනයේ සැරිසරති.
ගස් පෙළ ඉදිරී වැටෙයි.
සමහරු අපට උපදෙස් සපයති.

එය කියවා අවබෝධ කොට පහත අභ්‍යාසය කරන්න.

**මේ වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.**

i. අපේ ගමේ තරුණ කැල සිංහල අවුරුද්ද සඳහා ක්‍රීඩා තරගයක් සංවිධානය කිරීමට සැරසෙයි.

ii. දඩයක්කරුවන්ට බිය වූ සොර මුළ බියෙන් තැති ගෙන වනාන්තරයේ ඈතට පලා ගියහ.

iii. වන්දනා නඩය මේ වසරේ දී සිරිපා කරුණා කරයි.

iv. තමන් වැරදි කරමින් ම ඇතැමෙක් අනුන්ගේ වැරදි සෙවීමට උත්සාහ ගනිති.

v. විභාග ශාලාවට පැමිණි විභාග අපේක්ෂකයන්ගෙන් එක්කෙනෙක් නියමිත කාලයට පෙර ශාලාවෙන් ඉවත් වූහ.

vi. ජගත් ප්‍රජාව ශ්‍රී ලංකාව සංවර්ධනයට පා තබා ඇති හෙයින් වරින් වර ආධාර සැපයීමට ඉදිරිපත් වෙති.

## පැවරුම

01. මේ කවි පන්තිය තාලයට ගායනා කරන්න.

02. 'සත්ව කරුණාව' දක්වෙන කවි කීපයක් නිර්මාණය කරන්න.

03. විමලරත්න කුමාරගම කවියාගේ කවි පන්ති එකතුවක් සකස් කරන්න.

04. වන රජ දහනේ සද්දන්තයන් අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාවේ වටිනා සම්පතකි. වනයෙන් ගමට ගෙන හීලෑ කළ හස්තීහු සමාජයට අමිල සේවාවක් සිදු කළහ. රටේ ජනගහනය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම, විවිධ කර්මාන්ත ආරම්භ වීම වැනි හේතු මත වන ගත පෙදෙස් කුඩා විය. එහි උරුමකරුවන් වූ අලි ඇතුන් මේ වන විට ප්‍රශ්න රාශියකට මැදි ව දිනෙන් දින විනාශ වී යාම ඛේදනීය සිද්ධියකි.

ඉහත මග පෙන්වීම අනුව යමින් ඊට සරිලන මාතෘකාවක් යටතේ වචන 350 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.